බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசனம்,கலாசாரம் மற்றும் மத அலுவல்கள் அமைச்சு

Ministry of Buddhasasana, Cultural and Religious Affairs

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය

ஆண்டறிக்கையும் நிதிசார் கூற்றுக்களும்

Annual Report and Financial Statements

2020

ටවර් හෝල් රඟහල පදනම

டவர் மண்டப அரங்க மன்றம்

Tower Hall Theatre Foundation

පටුන

පිටුව

1. දැක්ම, මෙහෙවර, අරමුණ හා පරමාර්ථ 01
2. හැදින්වීම 02
3. ටවර් හෝල් රඟහල පදනම භාරකාර මණ්ඩලය 03
4. පාලන හා සංවර්ධන අංශය 05

a සංවිධාන සැලැස්ම 07

b. ටවර් හෝල් රඟහල පදනම මාණ්ඩලික නිළධාරින් 08

c. අනුමත කාර්ය මණ්ඩලය සහ 2020.12.31 දිනට 09
කාර්ය මණ්ඩලය

d. ඉල්ලා අස්වීම්,කොන්ත්‍රාත් කාලය අවසන් වීම්, පුහුණු පාඨමාලා 10
සඳහා සහභාගී වූ කාර්ය මණ්ඩල

E රංග ශාලා වෙන් කිරීම් 11

5 නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන් අංශය 13

6. 2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද 15-18
වැඩසටහන්

7. මුදල් අංශය 19

a. විගණකාධිපති වාර්තාව 21-31

b. අවසන් මූල්‍ය ප්‍රකාශය 33 -56

8. ස්තූතිය 57

ටවර් හෝල් රඟහල පදනම

දැක්ම

"ශ්‍රී ලංකාවේ ජාතික නාට්‍ය මධ්‍යස්ථානය බවට පත්වෙමින් ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමෙහිලා පුරෝගාමී ආයතනය බවට පත්වීම"

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමට සහ ප්‍රවර්ධනයට දායක වෙමින් ඒ සඳහා අවශ්‍ය දැනුම යටිතල පහසුකම් සපයමින් නූතන විශ්ව නාට්‍ය හා රංගකලා භාවිතයේ නව අත්දැකීම් තාක්ෂණය සහ ඥානය නොඅඩුව ලබා ගැනීමට අවශ්‍ය නව මංපෙත් සකසා දෙමින් නාට්‍ය හා රංගකලා නිර්මාණවේදීන් දිරිගන්වමින් රටේ සංවර්ධනයට මෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා නිර්මාණකරණයේ යෙදීමට ඔවුන් පෙළඹවීම.

අරමුණු හා පරමාර්ථ

(අ) ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ආ) රඟහල පිළිබඳ දැනුම අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම.

(ඇ) රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහය වීම.

(ඈ) ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීමේ, ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ සහ ඒවා රඟදැක්වීමේ නියුතු වීම.

(ඉ) පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා රඟහල ප්‍රයෝජනයට නොගතයුතුවන ලෙස ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහාද සුදුසුයැයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම,ආරක්ෂා කිරීම,පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම.



හැදින්වීම

ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම හා ටවර් හෝල් රඟහල ජාතික රඟහලක් ලෙස ප්‍රයෝජනයට ගැනීම මුඛ්‍ය පරමාර්ථය කොට නාට්‍ය හා රංග කලාව වෙනුවෙන් ස්ථාපිත අනෙකුත් අරමුණු හා පරමාර්ථයන් පෙරදැරි කර ගෙන 1978 අංක 01 දරණ ටවර් හෝල් රඟහල පදනම පනතින් ස්ථාපිත කරන ලද ටවර් හෝල් රඟහල පදනම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු නිලබලයෙන් පත්වන සාමාජිකයන් දස දෙනෙකුගෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් තුන් අවුරුදු කාලයක් සඳහා පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් පරිපාලනය කරනු ලැබේ.

ටවර් හෝල් රහහල පදනම භාරකාර මණ්ඩලය **2020**

නිල බලයෙන් පත්වන සාමාජිකවරු

01 ටවර් හෝල් රහහල පදනමේ සභාපති/
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා

02 ජාතික,උරුම ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන
කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු විදුර වික්‍රමනායක මැතිතුමා
- 2020.10.13 දින පැවති 296 වැනි භාරකාර මණ්ඩල රැස්වීමේදි ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් කරනු ලබන පත්කිරීමක් ලෙස (පනතේ 3(1)ඕ අනුව

03 බුද්ධ ශාසනසංස්කෘතික හා ආගමික කටයුතු ගරු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා

04 මුදල් ගරු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා

05 රාජ්‍ය පරිපාලන ,පළාත් සභා හා පළාත් පාලන ,ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය ජනක බණ්ඩාර
තෙන්නකෝන් මැතිතුමා

06 අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත් මහතා

07 බුද්ධ ශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාශයේ ලේකම් 2019.1-2.01 දින සිට 2020.08.13
එම්.කේ බන්දුල හරිස්චන්ද්‍ර මහතා

බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ,
මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා - 2020.08.13 දින සිට

08 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එන්.එච්.එම්.චිත්‍රානන්ද මහතා-2019.12.01 සිට 2020.08.13
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් කපිල සි.කේ . පෙරේරා මහතා - 2020.08.13 දින සිට

09 සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ තරණි අනෝජා ගමගේ මහත්මිය

10 කොළඹ මහ නගර සභාවේ ගරු නගරාධිපතිනී රෝසී සේනානායක මහත්මිය

11 කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්
පාලිත නානායක්කාර මහතා - 2019.07.10 සිට 2020 ජනවාරි මස දක්වා
නීතිඥ රෝෂිණී දිසානායක මහත්මිය - 2020 ජනවාරි මස සිට

<u>ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත්කරන සාමාජිකවරු</u>
<u>පත්වීමේ දින සිට වසර 03ක කාලයක් සඳහා</u>

01	ජී.ආර්.පෙරේරා මහතා		
02	ජයන්තා රුක්මණී සිරිවර්ධන මහත්මිය	-	2020.01.24 – 2021.02.02
03	චරිතා ප්‍රියදර්ශනී පීරිස් මිය		
04	රෝහණදේව පෙරේරා මහතා	-	2020.01.24 – 2020.07.14
05	හෂීම් ඕමාර් මහතා		

මහා භාණ්ඩාගාර නියෝජනය -කුලෝජා පීරිස් මෙනෙවිය ,නියෝජ්‍ය අධ්‍යක්ෂ ,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

නීතිඥ ඩග්ලස් සිරිවර්ධන මහතා ,අධ්‍යක්ෂ ජනරාල් ,ටවර් හෝල් රඟහල පදනම .

පාලන හා සංවර්ධන අංශය

- ටවර් හෝල් රඟහල පදනමේ සංවිධාන ව්‍යුහය -



91

04

95

ටවර් හෝල් රඟහල පදනම

ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් (2020.12.31 දිනට)

1. අධ්‍යක්ෂ ජනරාල් - නීතීඥ ඩග්ලස් සිරිවර්ධන මහතා

2. අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) - නිපුණ දිසානායක මහතා

3. අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්) වැ.බ - සම්පත් පෙරේරා මහතා

4. සහකාර අධ්‍යක්ෂ (මුදල්) - ඉන්දික ජයමිණි පරණගමගේ මහතා

5. සහකාර අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභසාධන හා වැඩසටහන්) හා - චන්දන බණ්ඩාර මහතා
සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) (වැ.බ)

6. සහකාර අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) - ආචාර්ය ෂර්මා ජයප්‍රකාශ් මහතා

7. සහකාර අධ්‍යක්ෂ (පාලන සහ සංවර්ධන) වැ.බ. - නයනි ලක්මාලි ලියනගේ මෙය

අනුමත කාර්ය මණ්ඩලය හා සිටින කාර්ය මණ්ඩලය 2020-12-31 දිනට

සේවා ගණය	වැටුප් **කේත** අංකය	අංකය	තනතුරු	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	HM-2-1	1	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
	HM-1-1	2	අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	1	0
		3	අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන,අධ්‍යාපන හාවැඩසටහන්)	1	1	0
	MM-1-1	4	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	0	1
		5	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූදල්)	1	1	0
		6	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරකෂණ)	1	0	1
		7	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩසටහන්)	1	1	0
		8	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන)	1	1	0
කෘතීය මට්ටම	JM-1-1	9	පරිපාලන නිලධාරී	1	1	0
		10	කළමනාකරු (රහඟල්)	3	3	0
		11	අභ්‍යන්තර විගණන නිලධාරී	1	1	0
	MA-4	12	සංවර්ධන සහකාර (අලෙවි)	1	1	0
		13	සංවර්ධන සහකාර (ගිණුම් හා මූල්‍ය)	1	1	0
		14	සම්බන්ධීකරණ නිලධාරී (පාඨමාලා)	1	1	0
		15	සම්බන්ධීකරණ නිලධාරී (වැඩසටහන් හා ප්‍රචාරණ)	1	1	0
		16	සම්බන්ධීකරණ නිලධාරී (සුභ සාධන)	1	1	0
		17	ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක	1	1	0
ද්විතීය මට්ටම	MA-2-1	18	වැඩ මූලික සිවිල්	1	1	0
		19	තාක්ෂණික සහකාර	1	0	1
		20	ශබ්ද පරිපාලක	1	0	1
		21	පොත් තබන්නා	1	1	0
	MA-1-1	22	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	26	23	3
		23	කළමනාකරණ සහකාර (මූදල් අයකැමි)	1	1	0
		24	කළමනාකරණ සහකාර (දෙමළ භාෂිත)	1	1	0
ප්‍රාථමික මට්ටම	PL-3	25	රියදුරු	6	5	1
		26	විදුලි කාර්මික ශිල්පී	1	1	0
		27	ශබ්ද ක්‍රියාකරු	4	1	3
			රංගාලෝක ශිල්පී	3	2	1
		28	නඩත්තුරු	1	0	1
	PL-2	29	රංගාලෝක ශිල්පී සහායක	3	0	3
	PL-1	30	කාර්යාල සහායක	7	4	3
		31	රංගශාලා සහායක	8	6	2
		32	පාලන මැදිරි සහායක	1	0	1
		33	රංග සේවා මැදිරි සහායක	1	1	0
		34	කෞතුකාගාර/ ලේඛනාගාර සහායක	1	1	0
		35	ශබ්ද ක්‍රියාකරු සහායක	3	3	0
		36	පොත් අලෙවිහල සහායක	1	1	0
			අනුමත එකතුව -	91	69	22

පුද්ගලික වන සේ ඇති තනතුරු - දැනට සේවයේ යෙදෙන

ද්විතියික මට්ටම ප්‍රථමික මට්ටම	MA 2-1	1	පරිගණක ක්‍රියාකරු		1
	PL 3	2	සම්බන්ධීකාරක (සංගීත)		1
	PL 2	3	කළමනාකාර සහායක		2
	මුළු එකතුව				**73**

සේවා දීර්ඝ කිරීම් හා සේවය අවසන් වීම

සමන් සොයිසා මහතා **2020-04-05** දක්වා

අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, අධ්‍යාපන සහ වැඩ සටහන්)

තනතුරු සඳහා පත් කිරීම්

නිපුණ දිසානායක මහතා	-	අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	-	2020.07.21
සම්පත් පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ (නා.ප්‍ර.අ.හා වැ.ස)	-	2020.10.14

සේවයෙන් ඉල්ලා අස්වීම්

පවනි මධුශානි මෙය-	කළමණාකරණ සහකාර	2020-07-10
මහේෂි මණිමේඛලා මෙය -	රංගශාලා සහායක	2020-04-30
දිනුෂ ලක්මාල් මහතා	- කාර්යාල කාර්ය සහායක	2020-09-26

විශ්‍රාම ගැන්වීම්

බර්නාඩ් එම් මාටිං මහතා	-	රංගශාලා සහායක	2020-08-31
සුජිත් ජයලාල් මහතා	-	කාර්යාල කා.සහායක	2020-08-31

සේවය අවසන් කිරීම්

මනෝජ් කුමාර මහතා	-	රියැදුරු	2020-03-02

පුහුණු හා පාඨමාලා සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලය

පුහුණු හා පාඨමාලාවේ නම	**කාල සීමාව**	**සහභාගී වූ ගණන**
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව	දින 03	1
කාර්යාල කළමණාකරණය හා මුදල් රෙගුලාසි	දින 02	3

ටවර් හෝල් රඟහල පදනම

රංග ශාලා සහ ශබ්දාගාරය වෙන්කිරීම් - 2020

මාසික වෙන් කිරීම් ප්‍රමාණය	මාසය.	වැඩසටහන												
		ටවර් රඟහල				එල්ෆින්ස්ටන් රඟහල				රුක්මණිදේවී රඟහල				ශබ්දාගාරය
		නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	පටිගත කිරීම්
	ජන	**1**	**1**	-	-	1	0	0	3	**1**	**1**	**1**	**6**	**4**
	පෙබ	**5**	**1**	**5**	-	14	0	0	5	**2**	**1**	**3**	**6**	**1**
	මාර්තු	**7**	**3**	-	-	1		0	2	**2**	-	**2**	**4**	-
	අප්‍රේල්	-	-	-	-	0	0	0	0	-	-	-	-	-
	මැයි	-	-	-	-	0	0	0	0	-	-	-	-	-
	ජුනි	-	-	-	-	0	-	1	2	-	-	-	-	**7**
	ජුලි	**6**	-	-	-	7	-	-	-	-	-	-	**4**	**8**
	අගෝ	**11**	-	-	-	16	-	-	1	-	-	-	**5**	**4**
	සැප්	**14**	-	-	-	25	0	0	0	-	**1**	**1**	**6**	**9**
	ඔක්	**1**	-	-	-	3	0	0	0	**1**	-	-	**1**	**3**
	නොවැ	-	-	-	-	0	0	0	0	-	-	-	-	-
	දෙසැ	**0**		-	-	0				-	-	-	-	1
එකතුව		**55**				**81**				**48**				**37**

නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන් අංශය

❖ **<u>අධ්‍යාපන, පර්යේෂණ හා සංරක්ෂණ</u>**

01. නාට්‍ය හා රංගකලා පාසල

- 2020.01.12 දින ජාතික රූපවාහිනී සේවය ඔස්සේ විකාශය වූ රංගභූමි වැඩසටහන සඳහා සහභාගීවිය.
- 2020.01.13, 14 හා 15 දිනයන්හි 2019 වර්ෂයට අදාළ භාත්බණ්ඩ විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්විය.
- 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නාට්‍ය හා රංගකලා පාසලට සිසුන් අතුළත්කර ගැනීමට අදාළ අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2020.01.17 දින වූ අතර, එදින වන විට ඉල්ලුම්පත් 222 ක් ලැබී තිබුණි.
- 2020.01.18 දින "පුංචි අපට දැන් තේරෙයි හා තොප්පි වෙළෙන්දා" නැමැති කෘතීන් දෙමළ භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කිරීම හා ''හරිස්චන්ද්‍ර නාටකය" කෘතිය මුද්‍රණයට අදාළ මිළ ගණන් කැඳවීමත්, එය ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැපික් ආයතනයට මුද්‍රණය සඳහා ලබාදීමත් සිදුකරන ලදී.
- 2020.01.20 දින එල්ෆින්ස්ටන් රඟහලේ අභ්‍යන්තර අලංකරණය සඳහා අධ්‍යාපනික හා ඓතිහාසික චරිනාකමකින් යුත් ඡායාරූප 40 ක් Mount කර ලබාගැනීම සඳහා පී.යූ.ඩී. පෙරේරා මහතාට ලබා දෙන ලදී.
- 2020.02.06 දින 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ අයදුම්පත් 222 හි තොරතුරු අඩංගු සී.ඩී තැටිය විභාග දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී.
- 2020.02.06 දින 2019/2020 වර්ෂයට අදාළව International Theatre Institute ආයතනයට සමාජික මුදල් වශයෙන් යූරෝ 1000 ක් ගෙවන ලදී.
- 2020.02.12 දින 2019/2020 අධ්‍යයන වර්ෂයේ සිසුන් පිළිගැනීමේ සාදය 2018/2019 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ සංවිධානයෙන් නාට්‍ය පාසල් පරිශ්‍රයේ දී පවත්වන ලදී.
- 2020.02.13 දින ලෝක නාට්‍ය දින සංදේශය දෙමළ හා සිංහල භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා භාරදෙන ලදී.
- 2020.02.24, 25 දිනයන්හි 2019/2020 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ ප්‍රථම අධ්‍යයන වර්ෂ ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන ලදී. මේ සඳහා සිසුන් 40 දෙනෙකු පෙනී සිටින අතර, ප්‍රයෝගික පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස වසන්ත විට්ටච්චි මහතා, ප්‍රදීප් චන්ද්‍රසිරි මහතා හා ආයතනය නියෝජනය කරමින් සම්පත් පෙරේරා මහතා සහභාගී වුහ.
- 2020.02.26, 27 දිනයන්හි 2018/2019 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ දෙවන අධ්‍යයන වර්ෂ ප්‍රථම ප්‍රායෝගික වාර පරීක්ෂණය පවත්වන ලදී. ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් මහාචාර්ය අනුර වික්‍රමසිංහ මහතා, රංජිත් බාලසුරිය මහතා හා ආයතනය නියෝජනය කරමින් සම්පත් පෙරේරා මහතා සහභාගි විය.
- 2020.02.28 දින නාට්‍ය පාසලේ සිසුන් සඳහා විශේෂ මාසික දේශනය පැවැත්විය. මෙහි සම්පත්දායකත්වය දරණ ලද්දේ නීතිඥ ඩග්ලස් සිරිවර්ධන මහතා විසිනි. එහි සම්පත්දායක සහායකත්වය ප්‍රදීප් ඇරගම මහතා හා බුද්ධිමාලි උදයන්ති දිසානායක මහත්මිය විසින් ලබාදෙන ලදී.

- මාර්තු 27 දිනට යෙදී ඇති ලෝක නාට්‍ය දිනය වෙනුවෙන් සිංහල හා දෙමළ නාට්‍ය උළෙලක් යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා පීඨය සමඟ එකාබද්ධව පැවැත්වීමට නියමිත අතර, ඒ සඳහා පූර්ව සංවිධාන කටයුතු වෙනුවෙන් සාකච්ඡාවක් 2020.01.27 දින යාපනය විශ්ව විද්‍යාලයේ පැවත්විය.
- 2020.08.10 දින අධ්‍යයන වර්ෂ 2017/2018 සිසුන්ගේ අධ්‍යයන කාර්යයක් ලෙස නිෂ්පාදනය වන ''සිහන රැලේ ඔපෙරාව" නාට්‍යයේ මුහුරත් උළෙල පැවැත්වීම හා පුහුණුවීම් කටයුතු ආරම්භ කිරීම සිදුවිය.

- 2020.08.12 දින භාත්බණ්ඩ විභාගය සඳහා අයදුම්පත් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- නාට්‍ය හා රංගකලා පාසලේ සිසුන් වෙනුවෙන් නේවාසික වැඩමුළු මාලාවක් 2020.08.25 සිට 2020.08.31 දින දක්වා මීගොඩ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ දී පැවැත්විය.
- 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ අධ්‍යයන කාර්යයක් ලෙස නිෂ්පාදනය වන ''සිහන රළේ ඔපෙරාව" නාට්‍යයේ පුහුණුවීම් කටයුතු 2020.09.01 දින පැවැත්වුණු අතර, එහි මංගල දර්ශණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු 2020.10.31 හා 2020.11.01 දිනයන්හි සම්පාදනය කරන ලදී.

- ❑ සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව ප්‍රාසාංගික කලා දෙදින පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට අදාළ පූර්ව කටයුතු 2020.09.13 දින සංවිධානය කරන ලදී.

- ❑ 2020.09.14 දින භාත්ඛණ්ඩ විභාගය සඳහා අයදුම්පත් නිකුත් කිරීම හා නැවත භාර ගැනීම ආරම්භ කරන ලදී.

- ❑ අධ්‍යයන වර්ෂ 2020/2021 සඳහා ටවර් නාට්‍ය හා රංගකලා පාසලට සිසුන් බඳවා ගැනීමට අදාළ ලිඛිත පරීක්ෂණය 2020.09.20 දින පැවැත්විය.

- ❑ 2018/2019 අධ්‍යයන වර්ෂ දෙවන වාර පරීක්ෂණය හා 2019/2020 ප්‍රථම අධ්‍යයන වර්ෂ දෙවන අධ්‍යයන වාර පරීක්ෂණ කටයුතු 2020.09.21, 22, 26 හා 27 දිනයන් හි සවිසිරිපාය පරිශ්‍රයේදී පැවැත්විණි.

- ❑ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල 2020.12.07 දින නිකුත් කරන ලදී.

- ❑ 2019/2020 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ දෙවන අධ්‍යයන වර්ෂ ප්‍රථම වාරය වෙනුවෙන් මාර්ගගත දේශන 2020.12.09 දින ආරම්භ කරන ලදී.

- ❑ 2020.12.18 දින සිට භාත්ඛණ්ඩ විභාගයේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීමට අදාළ කටයුතු සම්පාදනය කර තිබූ නමුත්, කොරෝනා වසංගත තත්වය හේතුවෙන් 2021.02.08 දිනට කල් දමන ලදී.

- ❑ 2020.12.09 දින 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ විභාග නිවේදනය විභාග දෙපාර්තමේන්තුවට යවන ලදී.

- ❑ 2020.12.26, 27, 28, 29 හා 30 යන දිනයන් හි 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර, කොරෝනා වසංගත තත්වය හේතුවෙන් 2021 ජනවාරි මස 15, 16, 17 හා 18 දිනයන් හි පැවැත්වීමට කටයුතු සුදානම් කරන ලදී.

- ❑ ටවර් හෝල් රඟහල පදනම විසින් ප්‍රවීණ නාට්‍යවේදිනී සෝමලතා සුභසිංහ මහත්මියගේ ''පුංචි අපට දැන් තේරෙයි හා තොප්පි වෙළෙන්දා'' කෘති දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම හා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණි දෑල ඛණ්ඩාර මහතාගේ ''හරිස්චන්ද්‍ර නාටකය'' කෘතිය ප්‍රකාශයට පත් කිරීමට අදාළ සෝදුපත් පරික්ෂා කිරීමේ කටයුතු 2020.12.31 දින සිදු කරන ලදී.

❖ <u>නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩසටහන් අංශය</u>

- ❑ **වන්දනා චාරිකාව - කතරගම**

ටවර් හෝල් රඟහල පදනම විසින් සෑම වසරකම අඛණ්ඩව සංවිධානය කරනු ලබන, ටවර් හෝල් රඟහල පදනම මගින් දීමනා ලබන ශිල්පින්ගේ වාර්ෂික වන්දනා චාරිකාව, 2019 වෙනුවෙන් මෙවර 2020.02.08 සහ 09 යන දෙදින කතරගම කිරිවෙහෙර වන්දනා කිරීම හා නූර්ති ගී ප්‍රසංගයක් පැවැත්වීම.

- ❑ **සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019**

සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019 අවසාන වටය සඳහා තෝරාගත් නාට්‍ය වල අධ්‍යක්ෂවරුන් සඳහා නාට්‍ය හා රංගකලා තෙදින නේවාසික වැඩමුළුවක් 2020 ජනවාරි 31 හා පෙබරවාරි 01 සහ 02 දිනයන්හි මීගොඩ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ දී පැවත්විණි. මෙම වැඩමුළුව සඳහා ගුරුභවතුන් 40 කට වැඩි පිරිසක් සහභාගී වූහ.

- ❑ **ශ්‍රී ලංකා නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නාට්‍යවේදීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා පැවැත්වෙන සුහද හමුව**

ටවර් හෝල් රඟහල පදනම පනතේ අරමුණු සාක්ෂාත් කිරීමේ අරමුණින් ශ්‍රී ලාංකේය නාට්‍යවේදීන්ගේ කලා නිර්මාණ ගුණාත්මකව හා සාර්ථකව කළ එළි දැක්වීමට අවශ්‍ය පහසුකම් හැකිතාක් සපයා දීමට ටවර් හෝල් රඟහල පදනම ගත් තීරණයට අනුව 2020/02/13 වන දින පැවති මෙම වැඩසටහන සඳහා නාට්‍යවේදීන් 100 ක් පමණ සහභාගී විය.

- ❑ **සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019**

සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019 අවසාන වටයේ තරඟ විනිශ්චය පෙබරවාරි 27, 29 හා මාර්තු 1, 2, 3, 8 දිනයන්හි මරදාන ටවර් රඟහලේ දී පැවත්විණි. අවසාන වටය සඳහා නූර්ති නාට්‍ය ජවනිකා 06 ක්, දිගු නාට්‍ය 06 ක්, කෙටි නාට්‍ය 16 ක් හා දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය 07ක් වශයෙන් ඉදිරිපත් විය.

❑ **ටවර් ශිල්පීන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය - 2020 / 05 /14 , 15, 16**

ටවර් හෝල් රහහල පදනම මගින් වාර්ෂිකව සිදු කරනු ලබන අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය වෙනුවෙන් ශිල්පීන් 54 ක් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය මලු ප්‍රදානය කරන ලද අතර, කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් එම භාණ්ඩ ඔවුන්ගේ නිවෙස් වෙත ලැබීමට සළස්වන ලදී.

❑ **2020 ජුනි මස පොහෝදින සිතුල්පව්ව රජමහා විහාරස්ථානයේ පැවති බොදු බැති ගී ප්‍රසංගය**

2020 ජුනි මස 05 වන දිනට යෙදෙන පොසොන් පොහෝ දින වෙනුවෙන් සිතුල්පව්ව රජමහා විහාරයේ බොදු බැති ගී ප්‍රසංගයක් පවත්වන ලෙසට අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් දන්වා සිටින ලදි.

ඒ වෙනුවෙන් ජ්‍යෝෂ්ඨ රංගන හා ගායන ශිල්පීන් අටදෙනෙකුගෙන් සහ විශාරද මනෝජ් පීරිස් මහතා ඇතුළු ජ්‍යෝෂ්ඨ වාද්‍ය ශිල්පීන්ගෙන් සමන්විත වාද්‍ය වෘන්දයක්ද සමගින් බොදුබැති ගී ප්‍රසංගයක් සිතුල්පව්ව රජමහා විහාරස්ථානයේ දී ඉතා විචිත්‍රවත් ලෙස පවත්වන ලදී. මෙම ප්‍රසංගය ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ සජීවිව විකාශය කරන ලදී.

මේ සඳහා අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු මැති ඇමතිවරුන් කීපදෙනකු හා විශාල බැතිමතුන් පිරිසක් සහභාගී විය. ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු මැති ඇමතිවරුන්ගේ විශේෂ ප්‍රසාදය මෙම ප්‍රසංගයට සහ ටවර් හෝල් රහහල පදනමට පිරිනමන ලදී.

❑ **එල්ෆින්ස්ටන් රහහල සැමරුම හා නවීකරණයෙන් පසු විවෘත කිරීමේ උත්සවයට සමගාමීව සංඝයා වගන්සේලා විසිපස්නමක් උදෙසා පිරිනැමූ දානමය පුන්‍යාකර්මය සහ සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය**

එල්ෆින්ස්ටන් රහහල ප්‍රති සංස්කරණයෙන් පසු නැවත විවෘත කිරීමේ උත්සවයට සමගාමීව සහ කොවිඩ්-19 ව්‍යවසනයෙන් පසු රංගශාලා මහජන දර්ශනය සඳහා නැවත විවෘත කිරීම වෙනුවෙන් අනුග්‍රාහක භවත්තුන්නේ ද දායකත්වය ඇතිව ටවර් හෝල් රහහල පදනමේ නිර්මාතෘ ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිදුන්ට, දිවංගත සභාපතිවරුන්ට, භාරකාර මණ්ඩල සාමාජිකයන්ට හා ටවර් හෝල් රහහල පදනමේ සේවයේ නියුතුව සිට මිය ගිය කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පිං පැමිණෙවීමත්, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට, ටවර් හෝල් රහහල පදනමේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සහ සමස්ත රටවැසියන්ට සෙත් පැතීම අරමුණ කර ගනිමින් 2020.07.17 වන දින ස්වාමීන් වහන්සේලා විසිපස්නමක් උදෙසා දහවල් දානය සහ එදින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වා පසුදින භීල් දානය පිරිනමන ලදී

❑ **ප්‍රේක්ෂා රංගකලා මහෝත්සවය - 2020**

කොවිට් -19 ව්‍යසනයෙන් පසු ජන ජීවිතය ක්‍රමයෙන් යථා තත්වයට පත් වුවද, රංග ශාලාවන්ගෙන් ඈත් වූ නාට්‍යවේදීන්, රංගන ශිල්පීන් සහ ප්‍රේක්ෂකයින් යළිත් රංග ශාලාවන් කරා එක් රොක් කර වේදිකා නාට්‍ය කෙෂ්ත්‍රයට නව පුනර්ජීවනයක් ලබාදීම අරමුණ කර ගනිමින්, ටවර් හෝල් රහහල පදනමේ ගරු සභාපති අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදේශකත්වයෙන් පැවැත්වූ "**ප්‍රේක්ෂා රංග කලාමහෝත්සවය** - 2020" ජුලි 24 සිට ජුලි 30

දක්වා ටවර් සහ එල්ෆින්ස්ටන් රංගශාලාවන්හිදී අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීය. මෙම "**ප්‍රේක්ෂා**" රංගකලා මහෝත්සවය නිරෝධායන නීතිරීති අනුගමනය කරමින් ක්‍රියාත්මක කරන ලද අතර, ප්‍රේක්ෂකයින් සඳහා සහනදායි මිලක් යටතේ ප්‍රවේශපත් අලෙවි කිරීමෙන්, එම ආදායම නාට්‍යවේදීන්ට ලැබෙන පරිදිත් පවත්වන ලදී.

❑ **මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ 24 වන ගුණ සැමරුම - 2020.08.16**

2020 අගෝස්තු මස 16 වන දිනට යෙදි ඇති මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ 24 වන ගුණ සැමරුම් උත්සවය අගෝස්තු මස 16 වන දින ටවර් හෝල් රහහල පදනමේ ගරු සභාපති, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි, අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් එල්ෆින්ස්ටන් රහහලේදී පවත්වන ලදී. එහිදී සිංහබාහු නාට්‍ය වේදිකා ගත කරමින් "**ප්‍රේක්ෂා**"රංග කලා මහෝත්සවයේ දෙවන අදියර ආරම්භ කරන ලදී.

- **ප්‍රේක්ෂා රංග කලා මහෝත්සවයේ දෙවන අදියර - 2020**

2020 ජූලි 24 වන දින සිට ජූලි 30 දක්වා පැවැත් වූ ප්‍රේක්ෂා රංග කලා මහෝත්සවය අතිශයින්ම සාර්ථක වූ බව නාට්‍ය අධ්‍යක්ෂකවරුන්, රංගන ශිල්පින්, ප්‍රේක්ෂකයන් හා විචාරකයන්ගේ අදහස විය. සාමාජ මාධ්‍යජාලා භාවිතා කරමින් බොහෝ පිරිස් සිය කෘතඥතාව පල කළ අතර, නැවතත් එවැනිම නාට්‍ය උළෙලක් පවත්වන ලෙසට දිගින් දිගටම ඉල්ලිම් කිරීම හේතුවෙන්, 2020 අගෝස්තු මස 16 වන දින සිට සැප්තැම්බර් මස 15 වන දින දක්වා ප්‍රේක්ෂා රංගකලා මහෝත්සවයේ දෙවන අදියර ලෙස ‘‘ප්‍රේක්ෂා ‘‘නාට්‍ය උළෙල පවත්වන ලදී.

- **සමස්ත ලංකා සිංහල හා දෙමළ නාට්‍ය තරගය - 2019**

සමස්ත ලංකා සිංහල හා දෙමළ නාට්‍ය තරගය - 2019 හි මාර්ග ගත නිළිණ ප්‍රදානෝත්සවය 2020.12.23 දින ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි.

01 මෙහිදී කෙටි නාට්‍ය අංශයේ හොඳම නිෂ්පාදනයට හිමි සම්මානය දිනාගනු ලැබුවේ මාවතගම ඩී.පී. වික්‍රමසිංහ විද්‍යාලය ඉදිරිපත්කල ප්‍රතිමා නාට්‍යයයි.

02. දිගු නාට්‍ය අංශයේ හොඳම නිෂ්පාදනයට හිමි සම්මානය දිනාගනු ලැබුවේ සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මධ්‍ය විද්‍යාලය ඉදිරිපත්කල මම වෙමි නොවෙමි නාට්‍යයයි.

03. නුර්ති නාට්‍ය අංශයේ හොඳම නිෂ්පාදනයට හිමි සම්මාන දිනාගනු ලැබුවේ නුගේගොඩ මහාමායා බාලිකා විද්‍යාලය ඉදිරිපත්කල ශ්‍රී වික්‍රම නාට්‍යයයි.

04. දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය අංශයේ හොඳම නිෂ්පාදනයට හිමි සම්මානය දිනාගනු ලැබුවේ මඩකලපුව මාමාංගේෂ්වරර් විද්‍යාලය ඉදිරිපත්කල පොලි මුගම් නාට්‍යයි.

සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරගය - 2019 හි තිළිණ හා සම්මාන ප්‍රදානෝත්සවය මාර්ග ගත ක්‍රමය භාවිතා කරමින් 2020.12.23 දින පවත්වන ලදී. මෙහිදී ජයග්‍රාහකයින් 70 දෙනෙකු සඳහා තිළිණ, සම්මාන හා මුදල් ත්‍යාග පිරිනැමූ අතර, ශ්‍රී ලාංකේය නුර්ති නාට්‍ය සම්ප්‍රදාය මතුපරපුරට දායාද කිරීම වෙනුවෙන් සිදුකලා වූ මෙහෙවර අගයමින් කලාභූෂණ ලයනල් ගුණතිලක මහතාට හා ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, අධ්‍යාපන හා වැඩසටහන්) ලෙසින් සමස්ත ලංකා පාසල් නාට්‍ය තරග සංවිධානය කිරීම වෙනුවෙන් ඉටුකළා වූ දීර්ඝ කාලීන සුවිශේෂී කාර්ය භාර්ය වෙනුවෙන් ආචාර්ය සමන් සොයිසා මහතාට උපහාර සම්මාන පිරිනැමීමක් මෙදින සිදුකරන ලදී.

<u>දෙමළ නාට්‍ය ප්‍රවර්ධන අංශය</u>

- **ශ්‍රී ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නාට්‍යවේදීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා පැවැත්වූ සුහද හමුව**

ශ්‍රී ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දෙමළ නාට්‍යවේදීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා සුහද හමුවක් 2020.03.12 දින ටවර් හෝල් රඟහල පදනම රැස්වීම් ශාලාවේ දී පැවත්විණි. මේ සඳහා දෙමළ නාට්‍යවේදීන් 40 ක් පමණ සහභාගී විය.

- **සාම්ප්‍රදායිකව පැවැත්වෙන සරස්වතී පූජාව**

එල්ෆින්ස්ටන් රඟහල විවෘත කිරීමෙන් අනතුරුව සරසවිපායෙහි කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය බැවින්, ඊට පෙර සාම්ප්‍රදායිකව පැවැත්වෙන සරස්වතී පූජාව 2020.07.22 දින පැවැත්විණි. ඒ සඳහා සුප්‍රමණියම් පූජකතුමා සහ ටවර් හෝල් රඟහල පදනමේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වුහ.

- **ප්‍රේක්ෂා දෙමළ නාට්‍ය උළෙල**

කොවිඩ් -19 ව්‍යසනයෙන් පසු ජන ජීවිතය ක්‍රමයෙන් යථා තත්වයට පත් වුවද, රංග ශාලාවන්ගෙන් ඈත් වූ නාට්‍යවේදීන්, රංගන ශිල්පින් සහ ප්‍රේක්ෂකයින් යළිත් රංග ශාලාවන් කරා එක් රොක් කර වේදිකා නාට්‍ය කෙෂ්ත්‍රයට නව පුනර්ජීවනයක් ලබාදීම අරමුණ කර ගනිමින්, ටවර් හෝල් රඟහල පදනමේ ගරු සභාපති අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදේශකත්වයෙන් පැවැත්වූ ‘‘**ප්‍රේක්ෂා දෙමළ කෙටි නාට්‍ය උළෙල** -2020’’, ඔක්තෝබර් මස 03 වෙනි දින එල්ෆින්ස්ටන් රංගශාලාවේදී අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීය.

මූදල් අංශය



ටවර් හෝල් රඟහල පදනම

2020 වර්ෂය සඳහාවූ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/A/THTF/01/2020/09 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 අප්‍රේල් 08 දින

අධ්‍යක්ෂ ජනරාල්
ටවර්හෝල් රහඟල පදනම

ටවර්හෝල් රහඟල පදනමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ටවර්හෝල් රහඟල පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මිතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නැවත ප්‍රකාශ කර නිබූ ගිණුම් අයිතම 9ක සංසන්දනාත්මක අගයන් හා ඉකුත් වර්ෂයේ අදාල අගයන් රු.771,107,315 කින් නැවත ගලපා නිබුණි. එසේ වුවත් එකී පෙර වර්ෂ ගැලපීම් නිවැරදිව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 54 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු කරුණු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොනිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ පන්තිය මූළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2016 වර්ෂයේදී පැවති ඉඩම් හා ගොඩනැගිලි වලින් ප්‍රධාන කාර්යාලීය ඉඩම් හා ගොඩනැගිලි පමණක් පිළිවෙලින් රු.614,000,000කට හා රු.163,000,000කට ප්‍රත්‍යාගණනය කර නිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට අගය රු.328,000,000ක් වූ ඉඩම් 2ක් හා රු.400,360,931ක් වූ ගොඩනැගිලි 4ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රත්‍යාගණනය කර නොනිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කමක සාධාරණ අගය ගිණුම් වලින් නිරූපණය කල යුතු වුවද ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙන් තවමත් භාවිතයට ගන්නා පිරිවැය රු.34,833,215ක් වූ වාහන 08 ක ඵලදායි ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත ශේෂය නැවත ගිණුම් වල ගැලපීමට කටයුතු කර නොනිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 15හි 14 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් ඇතුලත් කර හෝ අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කර නොනිබුණි.

(ඉ) 2020 ජනවාරි 01 දිනට පිරිවැය රු.161,750,000ක් වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හා රු.1,250,000ක් වූ ශබ්දාගාරය 2017 වර්ෂයේ සිට ක්ෂය කර නොනිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.16,300,000ක් හා සමුච්චිත ක්ෂය රු.65,200,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. මේ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.16,300,000ක් අඩුවෙන් හා සමුච්චිත ලාභය රු.48,900,000ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ඊ) 2018 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කර නිබූ කැබ් රථයක වටිනාකම 2019 ජනවාරි 01 දින ගිණුම්ගත කිරීමේදී ප්‍රමිතයෙහි 25 හා 43 ඡේද ප්‍රකාරව වත්කම අත්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකම වෙනුවට 2017 වර්ෂයේ රක්ෂණ කටයුතු සඳහා අගය කළ වටිනාකම වූ රු.4,000,000 පිරිවැය ලෙස සලකා ගිණුම්ගත කර නිබුණි.

(ඇ) වසර ගණනාවක් තිස්සේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එන එකතුව රු.79,091,701ක් වූ ශේෂයන් 5ක් පිළිබඳ තොරතුරු/ ලිපිගොනු/ ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පදනමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් පදනමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත ලබාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම් එම කරුණු මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම් අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව නිරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම් ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,

විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම් කොටසේ 1.2 (ආ), 1.2(ඇ), 1.2(ඈ), 1.2(ඊ), 1.2(ඒ) සහ 1.2(ඔ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති,රීති/ විධානයට යොමුව	විස්තරය
	---	---
(අ)	1978 අංක 1 දරන ටවර්හෝල් රහහල පදනම් පනතේ 8 වෙනි වගන්තිය හා පදනම් සතු සවිසිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම් වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන්	මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම් සතු සවිසිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට බදු දී තිබුණි. ඉකුත් බදු ගිවිසුම් 2016 මැයි 15 දින අවසන් වී තිබූ අතර එම අධිකාරිය දිගින් දිගටම ගොඩනැගිල්ලේ රැදී සිටියද 2016 මැයි 15 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කිසිදු බදු කුලියක් පදනම් වෙත අය වී නොතිබුණි.

(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 13(8) වගන්තිය	2019 වර්ෂය සඳහා මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර කළමනාකරණ විගණන වාර්තාව හාරකාර මණ්ඩලය විසින් සලකා බලා එහි ඇති කරුණු සම්බන්ධව ගැනීමට යෝජිත පියවර මාස 03 ක් තුල විගණකාධිපති වෙත දන්වා නොතිබුණි.
(ඇ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20(1) හා 102 වගන්ති	පදනම් 2018/2019 හා 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබූ අතර ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 6.1 ඡේදය	පදනමේ සේවකයන්ගේ පැයක අතිකාල අනුපාතය පැය 1ට පැය 1½ ක් ලෙස නිරණය කර එම අනුපාතය මත 2018 අප්‍රේල් 11 දිනැති අංක 02/2016(ii) දරණ කළමනාකරණ සේවා වක්‍රලේඛයේ 02(i)(අ) ඡේදයට පටහැනිව 2016 ජනවාරි 01 දින සිට 2018 අප්‍රේල් 11 දක්වා හිහ අතිකාල ලෙස රු.1,438,435ක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත සේවකයින් 51 දෙනෙකුට 2019 මාර්තු 08 දින ගෙවා තිබුණි. මෙම හිහ අතිකාල ගෙවීම සඳහා 2019 මාර්තු 15 දින හාරකාර මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා දී තිබුණද කළමනාකරණ සේවා අධ්‍යක්ෂ විසින් ගෙවූ හිහ අතිකාල අනුමත කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 119(1), 119(2) සහ 233	අනුමැතියකින් තොරව සේවකයින් 51 දෙනෙකුට 2019 මාර්තු 08 දින ගෙවන ලද අතිකාල රු.1,438,435ක් ආපසු අයකර ගැනීම 2020 ඔක්තෝබර් දක්වා පමා කර තිබුණි. ආපසු අයකරගත ගන්නා වාරික ගණන 12 ඉක්මවන පරිදි අයකර ගැනීමට බලය දිය හැකි වන්නේ අමාත්‍යාංශ ලේකම්වරයාට වුවද, අනුමැතියෙන් තොරව ගෙවන ලද අතිකාල වාරික 48 ක් දක්වා අයකර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා අවසරදී තිබුණ අතර 2020 දෙසැම්බර් 31 දින වන විට සේවකයන් 30 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,027,596ක ශේෂයක් නවදුරටත් අයවිය යුතුව පැවතුණි.

	(ii) මුදල් රෙගුලාසි 396	නිකුත් කර මාස 06 ක් ඉක්මවූ ධීවනාකම රු.124,430ක් වූ චෙක්පත් 15ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වා සහ 612 වැනි අධිකාරිය මත වූ රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත	ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප ලබා ගැනීමට කටයුතු කර නොනිබුණි.
(ඌ)	2003 ජූනි 02 දිනැති අංක පීරීඩී-12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය	
	(i) 4.2.6 වගන්තිය	2020 කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොනිබුණි.
	(ii) 5.1.3 හා 5.2.1 වගන්ති	2020 අයවැය වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නිබුණේ 2021 ජූලි 28 දිනදී වන අතර අයවැය ලේඛනය සමග අයවැයගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොනිබුණි.
	(iii) 6.5.1 වගන්තිය	2020 ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නිබුණේ 2022 ජනවාරි 12 දිනදීය.
	(iv) 6.5.3 වගන්තිය	2018 සහ 2019 වර්ෂවල වාර්ෂික වාර්තා 2022 ජනවාරි 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොනිබුණි.
	(v) 7.3 වගන්තිය	භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත 1997 සිට ක්‍රියාත්මක කර නිබුණු පදනමේ අත්පොත සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය හා භාණ්ඩාගාර එකඟතාවය ලබාගෙන නොනිබුණි.
(එ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014	2020 ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සමඟ ඇතුලත් කල යුතු ක්‍රියාකාරකම් සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර

	දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය	විගණන සැලසුම විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද්දේ 2021 ජුනි 28 දිනදීය.
(ඒ)	2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන අයවැය චක්‍රලේඛයේ 5.2(III) වගන්තිය	2020 වර්ෂය තුල සේවකයන් 16 කට රු.250,000 සීමාව ඉක්මවා ආපදා ණය රු.2,088,106 ක් ගෙවා තිබුණි. ආපදා ණය ගෙවීම සඳහා අයවැය මගින් භාරකාර මණ්ඩලය අනුමත කර තිබූ ප්‍රමාණය රු.2,481,987කින් ඉක්මවන පරිදි 2020 වර්ෂයේ ආපදා ණය ගෙවා තිබුණි.
(ඔ)	2020 ජුනි 10 දිනැති අංක 07/2020(iii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	වසරකට මාසික වාරික 02 ක් අඩුවෙන් සේවක ණය අයකරගෙන තිබූ අතර 2020 වර්ෂයේ රු.274,504 ක් අඩුවෙන් ණය ආපසු අයවී තිබුණි.

1.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

1.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් කරුණු**

(අ) 1978 අංක 01 දරන ටවර් හෝල් රහහල පදනම පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) රු.3,000ක්ව පැවති කලාකරු විශ්‍රාම වැටුප් දීමනාව 2019 මාර්තු 15 දිනැති අංක 2019/294/03/01 දරණ භාරකාර මණ්ඩල තීරණය මඟින් රු.7,500 දක්වා වැඩි කර තිබුණද ඒ සඳහා අවශ්‍ය වන අතිරේක මුදල් සපයා ගැනීමට කිසිදු උපාය මාර්ගයක් හඳුන්වා දී නොතිබුණි. මේ හේතුවෙන් ජනාධිපති සුභසාධන අරමුදලේ පොලී ආදායම රු.6,254,181ක්ව තිබියදී කලාකරුවන්ට රු.9,268,500ක් ගෙවීමට සිදුවීමෙන් රු.3,014,319ක හිඟ මුදල පියවා ගැනීමට වෙනත් ආදායමක් භාවිතා කිරීමට සිදුව තිබුණි.

(ඇ) පදනමට අයත් රහහල් සහන මිලට ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ඇති කරගෙන නොතිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබාදී පසුව භාරකාර මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ

අවස්ථා 10කදී රහහල් සහන මිලට් ලබාදීම හේතුවෙන් රු.789,000ක හා අවස්ථා 3කදී ගාස්තු අය නොකර ලබාදීම හේතුවෙන් රු.252,500ක කුලී ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව ක්‍රියාකාරී සැලසුමට අනුකූලව පිළියෙල කර නොතිබුණි. කාර්යසාධන වාර්තාවේ භෞතික ප්‍රගතිය දැක්වීමේදී ළඟාකරගත් ප්‍රතිශතය පමණක් දක්වා තිබූ අතර භෞතික ඉලක්ක හා භෞතික ප්‍රගතිය ඒකක වලින් දක්වා නොතිබීම හේතුවෙන් දක්වා තිබූ කාර්යසාධනය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ඉ) නාඩගම් ගී ඇතුලත් සංයුක්ත තැටියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 - 2020 වර්ෂ සඳහා එකතුව රු.1,603,450 ක් ඇස්තමේන්තු කර 2018 සහ 2019 වර්ෂ වල පිළිවෙලින් රු.61,665ක් හා රු.187,911ක් වශයෙන් එකතුව රු.249,576ක් වැය කර තිබුණද 2022 ජනවාරි 31 වන විටත් කාර්ය නිමකර සංයුක්ත තැටිය එළිදැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2020 දෙසැම්බර් 31 දිනට තනතුරු 11කට අදාලව පුරප්පාඩු 22ක් පැවති අතර ඉන් පුරප්පාඩු 13ක් පදනමේ තාක්ෂණික ගණ වල කාර්ය මණ්ඩලය සඳහා විය. ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බදවාගැනීම් 21 හාරකාර මණ්ඩල ආවරණ අනුමැතිය මත සිදුකර තිබූ අතර අභ්‍යන්තර බදවාගැනීම් 07කින් බදවා ගැනීම් 03ක් සඳහා මණ්ඩලීය අනුමැතිය ලබා දී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති



ටවර් හෝල් රඟහල පදනම

2020 වර්ෂය සඳහාවූ මුල්‍ය ප්‍රකාශය

ටවර් හොල් රහහල පදනම

2020 දෙසැම්බර් 31න් අවසන්වූ වර්ෂය සඳහාවූ

වත්කම්	සටහන්	2020 re	2019 Restated re
ජංගම වත්කම්			
බැංකුවේ හා අතැති මුදල	**6**	11,008,636	6,704,486
භාණ්ඩ හා තොග ලේඛන	**9**	2,516,796	2,483,092
තැන්පතු	**7**	158,000	158,000
කලින් ගෙවීම්	**7**	2,320,886	3,113,780
එක අවුරුද්දක් ඇතුළත ලැබිය යුතු ආපදා ණය	**7**	2,745,048	2,751,235
අත්තිකාරම්	**7**	4,849,694	3,133,453
ණය කරුවන්	**8**	2,548,357	2,799,473
වෙනත් ලැබිය යුතු දෑ	**8**	2,073,221	3,195,439
ආයෝජනා - THT හා TRT	**10**	124,568,211	124,568,211
ආයෝජනා - PWF	**10**	70,999,700	66,749,700
ජංගම දේපල එකතුව		**223,788,548**	**215,656,869**
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	**11**	1,618,062,659	1,703,247,904
නොනිමි වැඩ - RDMC		274,303	274,303
නොනිමි වැඩ - සරසවිපාය අලුත් වැඩියාව		4,736,893	2,564,773
එක අවුරුද්දකින් පසුව ලැබිය යුතු ආපදා ණය	**7**	9,757,297	10,406,583
ජංගම නොවන වත්කම් එකතුව		**1,632,831,152**	**1,716,493,563**
-			
වත්කම් එකතුව		**1,856,619,700**	**1,932,150,432**
බැරකම්			
ජංගම බැරකම්			
ණය හිමියන් හා උපචිත වියදම්	**12**	9,596,664	24,193,917
